19.07.2019

ද මැසිනොද් විද්‍යාලය - කඳාන
**De Mazenod College - Kandana**

21 S I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 12 ශ්‍රේණිය
2019 ජූලි පරීක්ෂණය

# ආර්ථික විද්‍යාව
# Economics

කාලය
පැය 03

'අ' කොටසින් ප්‍රශ්න 02 ක් ද, 'ආ' කොටසින් ප්‍රශ්න 02 ක් ද ඇතුළත් වන සේ ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## 'අ' උප කොටස

(1) i. හිඟකම සහ ආවස්ථික පිරිවැය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

ii. "නිෂ්පාදන හැකියා ආදර්ශය" යන්න නිර්වචනය කර, එය ගොඩනැගීමේ දී පදනම් කර ගන්නා උපකල්පනයන් සඳහන් කරන්න.

iii. හීනවන ආවස්ථික පිරිවැය සහ හීනවන පරිමාණානුකූල ඵල අතර වෙනස පැහැදිලි කරන්න.

iv. "පූර්ණ සේවා නියුක්තියක් පවතින සෑම විටම නිෂ්පාදන සංයෝගයන් හැකියා වක්‍රය මතුපිට තීරණය වේ." එකඟ වේද? යෝග්‍ය රූපසටහන් යොදා ගනිමින් ඉහත ප්‍රකාශනය විමසන්න.

v. සෑම සමාජයක්ම විසඳා ගතයුතු මූලික තේරීම් ගැටලු මොනවා ද?

(එක් කොටසකට ලකුණු 04 බැගින්)

(2) i. ආර්ථික පද්ධතියක දක්නට ලැබෙන ආයතනික ලක්ෂණ මොනවා ද?

ii. විධාන ආර්ථික පද්ධතිය හා සැසඳීමේ දී වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් තුළ සම්පත් බෙදා හැරීම වඩා කාර්යක්ෂම වේ. ඔබ එකඟවේද? පැහැදිලි කරන්න.

iii. "කා සඳහා නිපදවන්නේද?" යන්නෙන් කුමක් අදහස් වේද? විවිධ ආර්ථික පද්ධති විසින් එම ගැටලුව විසඳාගන්නේ කෙසේද?

iv. සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයක් කරා ගමන් කිරීමේ ශ්‍රී ලංකාවේ අභිලාෂය වර්තමානය වන විට කෙතෙක් දුරට සාර්ථක වී තිබේ ද? විමසන්න.

v. නිදහස් වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක් යනු කුමක් ද? එය කෙතෙක් දුරට ප්‍රායෝගික ආර්ථික පද්ධතයක් වේද?

(එක් කොටසකට ලකුණු 04 බැගින්)

Learning Resource Center
R
De Mazenod College
Kandana

(3) i. ඉල්ලුම් නීතිය සහ සැපයුම් නීතිය නිර්වචනය කරන්න.

ii. පාරිභෝගික හැසිරීම විශ්ලේෂණය කිරීමේ දී "ඉල්ලුම් නීතිය" කෙතෙක් දුරට ප්‍රායෝගික සංකල්පයක්ද?

iii. "පාරිභෝගික ආදායම වැඩිවන විට සියලුම පාරිභෝගික භාණ්ඩවල ඉල්ලුම වැඩිවේ." ඔබ එකගවේද? පැහැදිලි කරන්න.

iv. ඉල්ලුමේ හරස් මිල නම්‍යතාවය යනු කුමක් ද? එම සංකල්පයේ ප්‍රායෝගික වැදගත්කම කවරේ ද?

v. පහත සඳහන් අවස්ථාවල මිල ඉල්ලුම් හෝ මිල සැපයුම් නම්‍යතා අවස්ථාව සඳහන් කරන්න.

(a) $Qs = -100 + 15P$

(b) $Qd = 400$

(c) $Qs = 4P + 20$

(d) $Qs = \frac{1}{2}P$

(එක් කොටසකට ලකුණු 04 බැගිනි)

(4) i. $x$ භාණ්ඩය අළෙවි කරන එක්තරා වෙළෙඳපොළක් තුළ A, B, හා C යනුවෙන් පාරිභෝගිකයන් තිදෙනෙක් ද, u හා v යනුවෙන් ආයතන දෙකක් ද සිටී.

ඔවුන්ගේ පෞද්ගලික ඉල්ලුම් ශ්‍රිතයන්,

$$Q_A = 1900 - 20\,Px$$

$$Q_B = 1600 - 14\,Px$$

$$Q_C = 900 - 10\,Px$$ ද,

පෞද්ගලික සැපයුම් ශ්‍රිතයන්,

$$Q_U = -50 + 12\,Px$$

$$Q_V = 50 + 8\,Px$$

i. වෙළෙඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

ii. සමතුලිතයේ දී එක් එක් පාරිභෝගිකයන් ඉල්ලුම් කරන ප්‍රමාණය සහ එක් එක් ආයතනය සැපයුම් කරන ප්‍රමාණය වෙන වෙනම සොයන්න.

iii. සමතුලිතයේ දී මිල ඉල්ලුම් නම්‍යතාවය සහ මිල සැපයුම් නම්‍යතාවය ගණනය කරන්න.

iv. වෙළෙඳපොළ සමතුලිතයේ දී පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදන අතිරික්තය සොයන්න.

(එක් කොටසකට ලකුණු 05 බැගිනි)

## 'ආ' උප කොටස

(5) i. එක්තරා භාණ්ඩයක මිල රු. 40 දී අධි ඉල්ලුම් ප්‍රමාණය ඒකක 800 ක් වන අතර, සැපයුම් ප්‍රමාණය ඒකක 200 කි. භණ්ඩයේ මිල රු. 140 දී ඉල්ලුම් ප්‍රමාණය ශුන්‍ය වන අතර, අධි සැපයුම් ප්‍රමාණය ඒකක 1200 කි.

(අ) ඉල්ලුම් හා සැපයුම් වක්‍ර රූප සටහනක ඇඳ සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න. (ලකුණු 02)

(ආ) මෙම භාණ්ඩයේ ඒකකයක් විකිණිය හැකි අවම මිල රු. 120 ක් ලෙස රජය නියම කළහොත් එම තත්ත්වය ඉහත රූප සටහනේ දක්වා

(a) අවම මිල යටතේ නිෂ්පාදන අතිරික්තය (ලකුණු 02)

(b) අධි ඉල්ලුම් ප්‍රමාණය සොයන්න. (ලකුණු 02)

(ඇ) ඌන පූර්ණ ගෙවීමක් සහිතව රජය රු. 120/= මිල සහතික මිලක් ලෙස නියම කළේ නම්,

(a) වෙළෙඳපොළේ නව මිල (ලකුණු 02)

(b) රජයට දැරීමට සිදුවන පිරිවැය (ලකුණු 02)

(c) අහිමි වූ ආර්ථික අතිරික්තය සොයන්න. (ලකුණු 02)

ii. රජය කිසියම් භාණ්ඩයක් මත බද්දක් පැනවූ විට භාණ්ඩයේ වෙළෙඳපොළ මිල නොවෙනස්ව පවතිනුයේ කවර තත්ත්වයන් යටතේ ද? ඔබේ පිළිතුරු රූප සටහන් ඇසුරින් තහවුරු කරන්න. (ලකුණු 04)

iii. කිසියම් භාණ්ඩයක් වෙළෙඳපොළේ තීරණය වූ මිලට වඩා අඩු මිලක් යටතේ ආනයනය කරතැයි සිතන්න.

(a) මෙම තත්ත්වය රූපසටහනක දක්වන්න. (ලකුණු 02)

(b) නිදහසේ ආනයනය කිරීම නිසා බිහිවූ ආර්ථික ප්‍රතිවිපාක 4 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(6) i. ව්‍යාපාර ආයතනයක කෙටිකාලීන පිරිවැය සහ දිගුකාලීන පිරිවැය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. ව්‍යාපාර ආයතනයක කෙටිකාලීන සාමාන්‍ය පිරිවැය සහ ආන්තික පිරිවැය අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කර, එම පිරිවැය දෙකෙහි හැසිරීම තීරණය වීම කෙරෙහි බලපාන සාධක සඳහන් කරන්න. (ලකුණු 05)

iii. ආර්ථික විග්‍රහය තුළ මෙන්ම, ගණකාධිකරණයේ දී ද, "ලාභය" යන්න සමානව ගණනය කෙරේ. ඔබ එකඟ වේද? පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. සංක්‍රාම ඉපැයුම් සහ ආර්ථික බදු කුලිය අතර වෙනස පැහැදිලි කර, කිසියම් සාධකයක සමස්ත ඉපැයුම සංක්‍රාම ඉපැයුම් වන අවස්ථාවක් සහ සමස්ත ඉපැයුම ආර්ථික බදු කුලිය වන අවස්ථාවක් යෝග්‍ය රූප සටහන් ඇසුරින් වෙන වෙන ම ඇඳ පෙන්වන්න. (ලකුණු 05)

(7) i. "පූර්ණ තරඟකාරී ආයතනයක් මිල ගනුවෙකු ලෙස ක්‍රියා කරයි." පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. පූර්ණ තරඟය හා සැසඳීමේ ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළේ දැකිය හැකි සමානකම් දෙකක් සහ අසමානකම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

iii. සාමාන්‍ය අයභාරය සහ ආන්තික අයභාරය යන්න හඳුන්වා, ඒකාධිකාරී වෙළෙඳපොළක සාමාන්‍ය අයභාරයේ සහ ආන්තික අයභාරයේ හැසිරීම රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. කතිපයාධිකාරී වෙළෙඳපොළක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

v. පහත දක්වෙන දෑ ඔබ කවර වෙළෙඳපොළ ආකෘතියට ඇතුළත් කරන්නේ ද?

(අ) සුපිරි වෙළෙඳසැල් (ආ) Gym

(ඇ). ජාතික පුවත්පත් (ඉ) ඇස් කණ්නාඩි වෙළෙඳසැල් (ලකුණු 04)

(8) i. ව්‍යාපාර චක්‍රයක් යනුවෙන් කුමක් අදහස් වේද? එහි ප්‍රධාන අවධි මොනවාද? (ලකුණු 04)

ii. ජාතික ගිණුම්කරණ යන්නෙන් කුමක් අදහස් වේද? එය ඇස්තමේන්තු කළ හැකි ප්‍රධාන ආකාර මොනවා ද? (ලකුණු 04)

iii. සම්මත අභිමත ක්‍රමවේදයක් යොදා ගනිමින් වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය ඇස්තමේන්තු කර පෙන්වන්න. (ලකුණු 04)

iv. ජාතික ගිණුම් සැකසීමේ දී මතුවන ප්‍රධාන දෝෂය කුමක් ද? එය නිවැරිදි කර ගන්නේ කෙසේ ද? (ලකුණු 04)

v. ජාතික ගිණුම් සැකසීමේ ප්‍රායෝගික වැදගත්කම කවරේ ද? (ලකුණු 04